# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/26 - 2018 මාර්තු මස 28 වැනි බදාදා - 2018.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, 2018 මාර්තු මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 මාර්තු මස 28 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 27374 — 377 (2018/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| (1) | එම නිවේදනයෙහි "අංක (4) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය'' - ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |
| | (අ) | එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත පරිදි සංශෝධනය කිරීමෙන්<br>1. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු විෂයයන්ට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම |
| | (ආ) | එහි I වැනි තීරුවෙහි 3, 5, 11, 14, 15, 16, 17, 18 සහ 19 අයිතමයන් ඉවත් කිරීමෙන්; |
| | (ඇ) | එහි II වැනි තීරුවෙහි දැක්වෙන 2, 6, 7, 9, 10, 11, 12, 14, 15, 16, 17 සහ 18 අයිතමයන් ඉවත් කිරීමෙන්; |
| | (ඈ) | එහි II වැනි තීරුවෙහි දැක්වෙන "මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව" ආයතනයට පසුව පහත ආයතන එකතු කිරීමෙන්<br>▪ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව<br>▪ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් (සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම හැර) |
| | (ඉ) | ඒ අනුව, II වැනි තීරුවෙහි ආයතන නැවත අංක කිරීමෙන් |
| | (ඊ) | එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් පනත් ඉවත් කිරීමෙන් :<br>▪ මූල්‍ය නීති පනත (1949 අංක 58)<br>▪ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත (2002 අංක 35)<br>▪ විනිමය පාලන පනත (1953 අංක 24)<br>▪ ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)<br>▪ ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)<br>▪ යොවුන් සේනාංක පනත (2002 අංක 21)<br>▪ ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත (1939 අංක 48)<br>▪ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28) |
| (2) | එම නිවේදනයෙහි "අංක (6) තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |
| | (අ) | එම ශීර්ෂය "(6) බුද්ධ ශාසන අමාත්‍ය" වශයෙන් |
| | (ආ) | එහි I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත් කර, ඒ වෙනුවට අංක (27) බුද්ධ ශාසන අමාත්‍ය ශීර්ෂය යටතේ වූ I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඇතුළත් කිරීම |
| (3) | "අංක (6) බුද්ධ ශාසන අමාත්‍ය'' ශීර්ෂයෙහි I වැනි තීරුවෙහි දැක්වෙන 7 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;<br>"8. වඳවී යාමේ තර්ජනයට මුහුණ පාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතියෙහි පාර්ශවකරුවන්ගේ 2019 සමුළුව (CITES) සම්බන්ධීකරණය හා ඊට අදාළ කටයුතු<br>9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු<br>10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" | |
| (4) | එම නිවේදනයෙහි "අංක (8) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි | |

| | | |
|---|---|---|
| | (අ) | එහි I වැනි තීරුවෙහි 14 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්<br><br>"15. ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධීකරණයෙන් මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සාර්ව ආර්ථික කළමනාකරණය<br><br>16. ආදායම් එකතු කිරීම හා වියදම් පිළිබඳ පසු විපරම් කිරීම" |
| | (ආ) | එහි I වැනි තීරුවෙහි 15 අයිතමයේ සිට නැවත අංක කිරීමෙන් |
| | (ඇ) | එහි II වැනි තීරුවෙහි 22 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්<br><br>"23. ශ්‍රී ලංකා මහ බැංකුව<br><br>24. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම |
| | (ඈ) | එහි II වැනි තීරුවෙහි 23 අයිතමයේ සිට 36 අයිතමය දක්වා වූ අයිතමයන් ඒ අනුව නැවත අංක කිරීමෙන් |
| | (ඉ) | එම නිවේදනයෙහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)" යන්නට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්<br><br>■ මූල්‍ය නීති පනත (1949 අංක 58)<br>■ ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36) |
| (5) | එම නිවේදනයෙහි "අංක (11) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි ඃ | |
| | (අ) | එම ශීර්ෂය "අංක (11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය" වශයෙන් |
| | (ආ) | එහි I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත් කර, ඒ වෙනුවට "අංක (30) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය'' යටතේ වූ I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඇතුළත් කිරීමෙන් ; |
| (6) | (අ) | "අංක (11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය" ශීර්ෂයෙහි I වැනි තීරුවෙහි දැක්වෙන 10 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;<br><br>"11. මහනුවර කලාපය තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින් හා වැඩසටහන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරලීම<br><br>12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" |
| | (ආ) | "අංක (11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය'', ශීර්ෂයෙහි II වැනි තීරුවෙහි දැක්වෙන 9 වැනි අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ඃ<br><br>"9. සීමාසහිත ලංකා ලිට්රෝ ගෑස්" |
| (7) | එම නිවේදනයෙහි අංක (15) සංවර්ධන කාර්යභාර අමාත්‍ය ශීර්ෂය ඉවත් කිරීමෙන් ; | |
| (8) | එම නිවේදනයෙහි අංක (16) සිට අංක (20) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක කිරීමෙන් ; | |
| (9) | එම නිවේදනයෙහි අංක (21) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ඃ- | |

| | | |
|---|---|---|
| | (අ) | එහි I වැනි තීරුවෙහි දැක්වෙන 11 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;<br><br>"12. අභ්‍යනන්තරව දිගුකල් අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීමේ කාර්ය සාධන බලකායේ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයට අදාළ කටයුතු සම්බන්ධීකරණය<br><br>13. වන්නි දිස්ත්‍රික්කයේ විශේෂිත ප්‍රදේශයන්හි අභ්‍යන්තර අවතැන්වූ ජනතාව සඳහා ජීවනෝපාය හා යටිතල පහසුකම් දියුණු කිරීමේ රජයේ වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම"<br><br>14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" |
| | (ආ) | එහි II වැනි තීරුවෙහි දැක්වෙන 10 වන අයිතමය ඉවත් කිරීමෙන්; |
| | (ඇ) | එහි II වැනි තීරුවෙහි දැක්වෙන 9 වන අයිතමයට පසුව වන අනිකුත් අයිතම ඒ අනුව නැවත අංක කිරීමෙන්; |
| (10) | එම නිවේදනයෙහි අංක (20) සිට (26) දක්වා නැවත අංක කිරීමෙන් | |
| (11) | එම නිවේදනයෙහි බුද්ධ ශාසන අමාත්‍ය (අංක 27) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |
| | (අ) | එම ශීර්ෂය "අංක (26) තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය" වශයෙන්; |
| | (ආ) | එහි I වැනි II වැනි හා III වැනි තීරුවෙහි අයිතමයන් ඉවත් කර, ඒ වෙනුවට "අංක (6) තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍ය යටතේ වූ I වැනි II වැනි හා III වැනි තීරුවල අයිතමයන් ඇතුළත් කිරීමෙන්; |
| (12) | එම නිවේදනයෙහි අංක (28) සිට (29) දක්වා නැවත අංක කිරීමෙන්, | |
| (13) | එම නිවේදනයෙහි "රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය (අංක 30)" ශීර්ෂය පහත පරිදි සංශෝධනය කිරීමෙන්; | |
| | (අ) | "අංක (29) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය" වශයෙන් |
| | (ආ) | එහි I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත් කර, ඒ වෙනුවට "අංක (11) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය" යටතේ වූ I වැනි, II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඇතුළත් කිරීමෙන්; |
| (14) | (අ) | එම නිවේදනයෙහි අංක (31) ශීර්ෂය නැවත අංක ගත කිරීමෙන්; |
| (15) | එම නිවේදනයෙහි ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, (අංක 32) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි : | |
| | (අ) | එහි II වැනි තීරුවෙහි දැක්වෙන 8 වැනි අයිතමය ඉවත් කිරීමෙන්; |
| (16) | එම නිවේදනයෙහි අංක (32) සිට (36) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක කිරීමෙන්; | |
| (17) | එම නිවේදනයෙහි විදේශ රැකියා අමාත්‍ය (අංක 37) ශීර්ෂය ඉවත් කිරීමෙන්; | |
| (18) | එම නිවේදනයෙහි අංක (38) සිට (39) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක කිරීමෙන්; | |
| (19) | එම නිවේදනයෙහි "අංක (40) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |

| | | |
|---|---|---|
| | (අ) | "අංක (39) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය" වශයෙන්; |
| | (ආ) | එහි I වැනි තීරුවෙහි දැක්වෙන 12 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;<br>"13. උතුරු හා නැගෙනහිර පළාත්වල පුනරුත්ථාපනය හා නැවත පදිංචි කිරීම සඳහා වූ ආර්ථික හා යටිතල පහසුකම් දියුණු කිරීමේ රජයේ වැඩ සටහන්වලට හා ව්‍යාපෘති වලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය<br>14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" |
| | (ඇ) | එහි II වැනි තීරුවෙහි 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන්; |
| | (ඈ) | එහි II වැනි තීරුවෙහි 4 වැනි අයිතමයේ සිට නැවත අංක කිරීමෙන්; |
| | (ඉ) | එහි III වැනි තීරුවෙහි "තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)'' ඉවත් කිරීමෙන්; |
| (20) | එම නිවේදනයෙහි අංක (40) සිට (42) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක කිරීමෙන්; | |
| (21) | එම නිවේදනයෙහි "අංක (43) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |
| | (අ) | අංක (41) ශීර්ෂය "ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය'' වශයෙන්; |
| | (ආ) | එම නිවේදනයෙහි "අංක (43) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය" යටතේ වූ I වැනි II වැනි III වැනි තීරු වෙනුවට පහත සඳහන් සංශෝධනය ආදේශ කිරීමෙන්; |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති* |
| 1. ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන විෂයයන්ට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>3. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි ඵලදායී ක්‍රියාකාරීත්වය ස්ථාපිත කරනු පිණිස අනෙකුත් අදාළ අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය | 1. ජාතික තරුණ සේවා සභාව<br>2. ජාතික යොවුන් සේනාංකය<br>3. ජාතික යෞවන තිලිණ ප්‍රධාන අධිකාරිය<br>4. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය<br>5. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය<br>6. ගාලු උරුමය පදනම<br>7. ජාතික මෙහෙයුම් මැදිරිය<br>8. ජාතික රක්ෂණ භාර අරමුදල | ■ ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)<br>■ යොවුන් සේනාංක පනත (2002 අංක 21)<br>■ ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>■ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)<br>■ ගාලුඋරුමය පදනම පනත (1994 අංක 7)<br>■ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත (2002 අංක 35)<br>■ විනිමය පාලන පනත (1953 අංක 24) |

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යාවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති |
| 4. ජාතික ප්‍රතිපත්ති ඇගයීම හා අධීක්ෂණය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාට සහාය වීම | 9. වර්ජන, කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල | ■ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28) |
| 5. යෞවන කටයුතු විෂයයට අදාළ ව්‍යාපෘති, වැඩසටහන් සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම | 10. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | ■ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46) |
| 6. තරුණ පරපුර නිවැරදි දිශානතියකට යොමුකිරීම අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 11. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>12. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 7. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 13. මිලෝදා ආයතනය | |
| 8. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 9. තරුණ සංවිධාන සම්බන්ධ කටයුතු | | |
| 10. තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් ස්වෙච්ඡා වැඩසටහන් සම්පාදනය | | |
| 11. කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුලුව දක්ෂිණ ආර්ථික කලාපය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම | | |
| 12. හම්බන්තොට ආර්ථික කලාපය, දක්ෂිණ සංචාරක සංවර්ධන කලාපය, හම්බන්තොට ගුවන් - නාවික බලසැපයුම් කේන්ද්‍රය ඇතුළුව දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 13. දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම | | |
| 14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

| | | |
|---|---|---|
| (22) | එම නිවේදනයෙහි "අංක (44) විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි; | |
| | (අ) | "අංක (42) විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍ය" වශයෙන්; |
| | (ආ) | එහි I වැනි තීරුවේ දැක්වෙන 5 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්;<br><br>6 විදේශ රැකියා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>7 සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තියමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය ඉහළ දැමීම<br><br>8 විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා නව නීති හඳුන්වාදීම<br><br>9 රැකියා නියෝජිතායතන නියාමනය සහ අධීක්ෂණය කිරීම<br><br>10 විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම<br><br>11 II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>12 II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම |
| | (ඇ) | එහි II වැනි තීරුවේ දැක්වෙන 4 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්;<br><br>5. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br><br>6. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය |
| | (ඈ) | එහි III වැනි තීරුවේ "ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)" ට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්;<br><br>▪ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත (1985 අංක 21)<br>▪ විදේශ රැකියා නියෝජිතායතන පනත (1980 අංක 32) |
| (23) | එම නිවේදනයෙහි අංක (45) ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය ශීර්ෂය පහත සඳහන් පරිදි ; | |
| | (අ) | "අංක (43) ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය'' |
| (24) | එම නිවේදනයෙහි "අංක (46) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :- | |
| | (අ) | "අංක (44) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය'' |
| | (ආ) | එහි I වැනි තීරුවෙහි දැක්වෙන 4 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;<br><br>"5. විශේෂයෙන් නැගෙනහිර පළාත තුළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා වන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br><br>6. භූ සම්පත්හි තිරසර භාවිතය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br><br>7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම'' |

| | | |
|---|---|---|
| | (ඇ) | එම නිවේදනයෙහි II වැනි තීරුවෙහි දැක්වෙන 2 වැනි අයිතමයට පසුව පහත සඳහන් අයිතමය එකතු කිරීමෙන්<br>"3. කන්තලේ සීනි සමාගම" |
| (25) | එම නිවේදනයෙහි අංක (47) සිට (51) දක්වා නැවත අංක කිරීමෙන් | |
| (26) | (අ) | එම නිවේදනයෙහි ප්‍රාදේශීය සංවර්ධන (අංක 51) අමාත්‍ය ශීර්ෂයේ I වැනි II වැනි හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය, I වැනි II වැනි හා III වැනි තීරු හා අයිතමයන් ඇතුළත් කිරීමෙන්; |

(50) නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු පනත්* |
| 1. නීතිය හා සාමය පිළිබඳ විෂයයන් හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම්<br><br>2. නීතිය හා සාමය පවත්වාගෙන යාම<br><br>3. සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම<br><br>4. ජාතික පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් අනුව පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>5. සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම<br><br>6. රථවාහන ගමනාගමනය පාලනය කිරීම<br><br>7. අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය<br><br>8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. පොලිස් දෙපාර්තමේන්තුව<br><br>2. ජාතික අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලය<br><br>3. තරුණ විශෝධන පුහුණු පාසල | ■ පොලිස් ආඥා පනත (1865 අංක 16)<br>■ මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)<br><br>■ ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)<br><br>■ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)<br><br>■ තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) පනත (1939 අංක 28)<br><br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

04 - 464

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.